# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.10 පැය 2030 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 702/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

<u>**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු**</u>

**01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගොතටුව පොලිස් ස්ථානය.**

2025.04.10 වන අද දින උදෑසන කාලයේ ගොතටුව පොලිස් වසමේ මහවත්ත හන්දිය ප්‍රදේශයේදී ගොතටුව පොලිස් ස්ථානයේ නිලධාරී කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 800 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 41 ක් වන රාජගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගොතටුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය.**

2025.04.10 වන අද දින අළුයම් කාලයේ කෙසෙල්වත්ත පොලිස් වසමේ අක්බාර් පටුමග ප්‍රදේශයේදී කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 21 මිලිග්‍රෑම් 800 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන කෙසෙල්වත්ත පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකාරිය වයස අවුරුදු 55 ක් වන කොළඹ 12 ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

කෙසෙල්වත්ත පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දඹගල්ල පොලිස් ස්ථානය.**

2025.04.10 වන දින දහවල් කාලයේ දඹගල්ල පොලිස් වසමේ දියකොලයාය ප්‍රදේශයේදී දඹගල්ල පොලිස් ස්ථානයේ නිලධාරින් කණ්ඩායමක් විසින් ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර **විදේශීය රටක නිෂ්පාදිත බෝර 12 වගර්යේ ගිනි අවියක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 60 ක් වන දොඹගහවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දඹගල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**04. මාරක රිය අනතුරක් - කඩවත පොලිස් වසම.**

2025.04.10 වන අද දින දහවල් කාලයේ කඩවත පොලිස් වසමේ කොළඹ මහනුවර මාගර්යේ 09 කණුව හන්දිය අසලදී නුවර දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාගර්ය අයිනේ නවතා තිබූ ලොරි රථයක් හේතුවෙන් මාගර්යේ දකුණට ගැනීමේදී පිටුපසින් පැමිණි ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු තුවාල ලබා රාගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 72 ක් වූ නුගේගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර කඩවත පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - වැලිගම පොලිස් වසම.

2025.04.10 වන අද දින දහවල් කාලයේ වැලිගම පොලිස් වසමේ ගාල්ල මාතර මාගර්යේ පැලෑන ප්‍රදේශයේදී වැලිගම දෙස සිට මිරිස්ස දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව මාගර්යේ පෙරලී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ රියදුරු තුවාල ලබා වැලිගම වලාන රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා මාතර රෝහලට මාරුකර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 18 ක් වූ මිරිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වැලිගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**